**ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූලි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2022 අගෝස්තු 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳව නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපළ පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2020 වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-06) සහ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත් කළ (ඒසීඒ - 06) ප්‍රකාශයේ සඳහන් කාර්යාල උපකරණ ආරම්භක ශේෂ වටිනාකම රු.786,350 ක් අඩුවෙන් ද, පරිගණක, විද්‍යුත් උපකරණ හා ගෘහ භාණ්ඩ වටිනාකම රු.786,350 ක් වැඩියෙන් ද සටහන් වී තිබුණු අතර අදාළ වෙනස්කම් වත්කම් ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | දෝෂ දැනටමත් හඳුනාගෙන ඇති බැවින් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | පෙර වර්ෂ අවසාන ගිණුම් ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ඉදිරියට ගෙන ආ යුතුය. |
| (ii) | වටිනාකම රු.36,400,000 ක් වූ, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ බත්තරමුල්ලේ පිහිටි නිල නිවස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේපළ පිරියත සහ උපකරණ යටතේ ඇතුළත් කර තිබුණු නමුත්, එය පිහිටි ඉඩමෙහි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මගින් ඉදිරිපත් කර නොතිබුණි. | නිල නිවාසය පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමුකර ඇත. | නිල නිවස පිහිටි ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කළ යුතුය. |

**(ආ) අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ-03) අනුව අග්‍රිම ලැබීම් හා පියවීම් අතර වෙනසක් නොතිබුණු නමුත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන (SA-70) අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.330,000 ක් වී තිබුණි. | 2021.10.15 දින නිකුත් කළ අග්‍රිම රු. 330,000 භාණ්ඩාගාරයෙන් ලද මුදල් බව හඳුනා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙලෙස නොපියවූ අත්තිකාරම් ලෙස වර්ෂ අවසාන ශේෂ මගින් පෙන්නුම් කරයි. 2022 වසරේ මාසිකව භාණ්ඩාගාර මුද්‍රිත සමග සැසඳීම් කටයුතු සිදු කරන බැවින් ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට වගබලා ගන්නා බව කාරුණිකව දන්වමි | දෙපාර්තමේන්තු පොත්වල ශේෂය භාණ්ඩාගාර පොත්වල ශේෂය හා සමාන විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන වැය විෂයයන් තුනක් සඳහා වෙන් කළ රු.74,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.38,319,896 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් සියයට 59 ත් සියයට 100 ත් අතර පරාසයක් ගෙන තිබුණි. ඒ අනුව වෙනත් සංවර්ධන කාර්යයන් වෙනුවෙන් වැය කිරීමට හැකිව තිබුණු රු.38,319,896 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අහෝසි වී තිබුණි. | රටේ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මුදල් අමාත්‍යාංශයෙන් 2021.08.31 දිනැතිව නිකුත් කළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මූලධන වැය විෂයයන් වලින් ඉතිරි කිරීම් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබිණි. ඒ අනුව ප්‍රාග්ධන වැය විෂයන් අහුරා තැබීම සිදු විය. | සලසාගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |

### 2.2 නීති ,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ. 104(3) | පාඩු හෝ අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා ප්‍රමාද වේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම එවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 03 දින අංක NA - 6026 දරන වෑන් රථයට අනතුරකින් සිදු වූ රු.10,500 ක අලාභය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් | ප්‍රමාදයන් සිදුවී ඇති බව පිළිගනිමි. 2022 වර්ෂයේ අප්‍රේල් මාසය තුළ මෙම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | මු.රෙ. 104(3) ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීම සඳහා මාස 08 ක පමණ කාලයක් ගතව තිබුණු අතර 2022 මාර්තු 25 දින වන විටත් පරිපූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | | |
| | මු.රෙ. 1645(අ) | දෙපාර්තමේන්තුව සතු වාහන 41ට අදාළ ලොග් සටහන් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | දෙපාර්තමේන්තු වාහන 41 ට අදාළ ලොග් සටහන් පොත් මේ වනවිට යාවත්කාලීන කර ඇත. | මු.රෙ. 1645(අ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>------------------- | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට ම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2020, 2021 වර්ෂවල දිවයිනේ පැවැති වසංගත තත්ත්වය යටතේ වර්ෂයේ වැඩි කාලයක් කාර්යාල වසා තැබීම සහ සෞඛ්‍ය නීති රීති යටතේ පවත්වාගෙන යාම නිසා චක්‍රලේඛය අනුව ඉන්ධන පරීක්ෂාවන් සමස්ත වාහන සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඉදිරියේදී පවතින පහසුකම් මත මෙම කාර්යය සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදුකළ යුතුය. |
| | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පුරවැසි සේවා ප්‍රඥාප්තිය පිළියල කර ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කළ යුතුය. |
| | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛනයේ ඇමුණුම් 02 ආකෘතිය | චක්‍රලේඛයේ ඇමුණුම 02 පරිදි එම ආකෘතිය පදනම් කරගෙන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සැලැස්ම පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මානව සම්පත් සැලැස්ම පිළියල කිරීම සඳහා සටහන් කර ගතිමි. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) රාජ්‍ය මුදල් චක්‍රලේඛ<br>-------------------<br>2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන චක්‍රලේඛය | රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය බාර ගැනීම හෝ භාරව සිටීම එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධව පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන් පිළිබඳ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යා යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ සඳහා නිලධාරින්ගේ නම් වලින් ඉතුරුම් ගිණුම් විවෘත කිරීමට කටයුතු සිදුකරමින් පවතී. | ඇප තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී බිම්සවිය වැඩසටහන වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදනය රු.87,930,359 සිට රු.124,000,000 ක් දක්වා සියයට 41 කින් වැඩිකර තිබුණු නමුත්, එක් එක් කාර්යන් වෙනුවෙන් සැලසුම් කරන ලද ඉලක්ක 2020 වර්ෂයට සාපේක්ෂව සියයට 15 සිට සියයට 22 ක ප්‍රතිශයකින් සමාලෝචිත වර්ෂයේදී පහත හෙළා තිබුණි. | රට තුල පැවති කොවිඩ් වසංගත තත්වය හා සෞඛ්‍ය නීතිරීති මේ සඳහා හේතුවිය. | බිම් සවිය වැඩසටහනේ ප්‍රගතිය ඉහළ නැංවීම සඳහා වාර්ෂික ඉලක්ක පිහිටුවීම හා ඒවා ලඟාකරගැනීම සිදුකළ යුතුය |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බිම්සවිය වැඩසටහන 2002 වර්ෂයේ ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට දිවයිනේ සියලුම ඉඩම් මැන හිමිකම් සහතික නිකුත් කිරීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට මෙම වැඩසටහන සඳහා දරා ඇති සමස්ත | බිම්සවිය වැඩසටහන කාර්යක්ෂමව කරගෙන යාමට අවශ්‍ය ආයතන අතර සහයෝගීතාවය ඇතිකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ඇති බාධා හඳුනාගෙන එවා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | පිරිවැය රු.මිලියන 5,635.6 ක් වී තිබුණු අතර ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 17 ක් ගත වී ඇතත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 331න් 66 ක පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. තවද, ආරම්භ කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 ට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ 3899 න් මිනුම් කටයුතු අවසන් කර තිබුණේ කොට්ඨාශ 1394 ක පමණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය අසතුටුදායක මට්ටමක පැවතුණි | | |
| (ආ) | 1897 මුඩුබිම් ආඥා පනත හා 1931 ඉඩම් නිරවුල් ආඥා පනත ක්‍රියාත්මක කිරීමට අදාළව පවත්වාගෙන යනු ලබන වසර සියයකට වඩා පැරණි ඉඩම් ලෙජර හා අනෙකුත් ලේඛන සංරක්ෂණය සඳහා 287-2-1-0-2509 වැය විෂයය යටතේ රු.8,000,000 ක මුදලක් වෙන්කර තිබුණ ද, අදාළ ලේඛන පරිලෝකනය කිරීමේ කාර්යය සඳහා එයින් කිසිදු ප්‍රතිපාදනයක් උපයෝජනය කිරීමට අපොහොසත්ව තිබුණි. | රට තුළ පැවති කොවිඩ් වසංගතය හා සෞඛ්‍ය නීතිරීති මත ලේඛණ පරිලෝකන කටයුතු කරගැනීමට නොහැකිවිය. | වාර්ෂික ඉලක්ක සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රතිපාදන වෙන්කළ වර්ෂය තුළදීම භාවිතා කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 02 ක කාලයක සිට දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගාල් කර තිබුණු අංක 53 ශ්‍රී 0049 දරන අබලන් ඩබල් කැබ් රථය 2019 මැයි මාසයේදී රු.2,000,000 කට තක්සේරු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන ආනයනය සීමා කිරීම මත අපහරණය සම්බන්ධව තවදුරටත් උපදෙස් ලබා ගැනීමට යොමුකර ඇත. | අදාළ වාහන අපහරණය කිරීමට හෝ අලුත්වැඩියාකර ධාවනයේ යෙදවීමට කටයුතු කළයුතුය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයට අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් ප්‍රධාන ණය කරුවන්ගෙන්, ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කරුවන්ගෙන් අයකරගත නොහැකි නම් නීතිපති උපදෙස් අනුව කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් සහ සේවය අතහැර ගොස් තිබුණු නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.205,369 ක් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 4.6 ඡේදය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මිය ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් එක් සේවකයකුගේ ණය අයකරමින් පවතින අතර අනෙක් සේවකයා වෙත මේ දක්වා මරණ පාරිතෝෂිකය ගෙවා නොමැති අතර මරණ පාරිතෝෂිකය ගෙවීමේදී ණය අයකර ගැනීමට සටහන් කරගෙන ඇත. ණය ගෙවන ලෙසට සේවය හැරගිය සේවකයා ලිපියක් මගින් දැනුවත් කර ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | 2021 වර්ෂයේදී හිමිකම් සහතික 60,000 ක් නිකුත් කිරීමට සැලසුම් කර රු.124,000,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, වර්ෂය තුළ නිකුත් කර තිබුණු හිමිකම් සහතික සංඛ්‍යාව 13,907 ක් වූ අතර දරන ලද තත්‍ය වියදම රු.94,406,000 ක් විය. ඒ අනුව සහතිකයක් නිකුත් කිරීමට ඇස්තමේන්තු ගත මුදල රු.2,067ක් වුවත්, තත්‍ය වියදම රු.6,788 ක් වී තිබුණි. | පසුගිය කොවිඩ් වසංගත කාලය තුළ කාර්යාල වසා තැබීම හේතුවෙන් ක්ෂේත්‍රගත රාජකාරී සිදු කළ නොහැකි වීම, පත්ඉරු පරීක්ෂා කිරීමේ අපහසුතා ආදියේ බලපෑම මත හිමිකම් තීරණ ගැසට් කිරීම සංඛ්‍යාත්මකව අඩු වී ඇති බව පිළිගනිමි. මේ සම්බන්ධයෙන් රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමග එක්ව ප්‍රගතිය තව දුරටත් වැඩිකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | සැලසුම් කළ ඉලක්කයන් ලඟාකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස්කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂය තුළ ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයෙන් නිකුත් කරන ලද හිමිකම් සහතික 22,485 ක් වූ අතර හිමිකරුවන් වෙත නිකුත් කළ සහතිකපත් සංඛ්‍යාව 13,907 ක් පමණක් විය. හිමිකම් සහතික බෙදා හැරීමේ පවතින දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවදුරටත් හිමිකරුවන් අතර බෙදා හැරීමට ඉතිරිව තිබුණු හිමිකම් සහතික පත්‍ර සංඛ්‍යාව 21,231 ක් වී තිබුණි. | 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා තීරණ දීමේදී කොවිඩ් වසංගත තත්වය සහ එක් ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයක් යටතේ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රදේශීය කාර්යාල 5-6 සමග සම්බන්ධතා පැවතීම බලපා තිබුණු අතර හිමිකම් සහතික නිකුත් කිරීමේ දී එම සහතික ලබා ගැනීම සඳහා ඉඩම් හිමියන් ඉදිරිපත් නොවීම, හිමිකරුවන්ගේ වර්තමාන පදිංචිය සොයාගැනීමට නොහැකි වීම වැනි කරුණු මත හිමිකම් සහතික නිකුත් කිරීමේ ප්‍රගතියේ යම් අඩුවක් දැක්වුවද ඉදිරියෙදී ප්‍රගතිය වර්ධනය කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී. | හිමිකම් සහතික බෙදා හැරීමේදී ඇතිවන දුර්වලතා හඳුනාගෙන එවා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට හිමිකම් සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් ඇති වූ නිරවුල් කළ නොහැකි විවිධ ගැටලු හේතුවෙන් පසෙක තබන ලද මුළු ලිපිගොනු සංඛ්‍යාව 455,271 ක් බව වාර්තා කර තිබුණු අතර වැලිගෙපොළ, රත්මලාන, දෙහිවල, නල්ලූර් ප්‍රාදේශීය කාර්යාලවලින් පසෙක තැබූ ලිපිගොනුවලට අදාළ තොරතුරු සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අනාවරණය කරගෙන නොතිබුණු හෙයින් ඉහත සංඛ්‍යාවට ඒවා ඇතුළත්ව නොතිබුණි. | 2002-2021 කාල පරාසය තුල දිවයිනම ආවරණය වන පරිදි සියලුම ඉඩම් මැන සහතික නිකුත් කිරීම සැළසුම් කර තිබුණද, මැනුම් කටයුතු සඳහා මිනින්දෝරුවන්ගේ හිඟකම, සහකාර කොමසාරිස්වරුන් හා විමර්ශණ නිලධාරීන්ගේ හිඟකම මෙම වැඩසටහන ව්‍යාප්ත කිරීමට බාධාවක් වී ඇති අතර, මේ වන විට ප්‍රගතිය වර්ධනය කරගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. පසෙක තැබූ ලිපිගොනු සම්බන්ධව ප්‍රගතිය පරික්ෂා කිරීම මාසිකව නිරීක්ෂණය කරමි. | පසෙක තැබුණු ලිපිගොනු වල පවතින ගැටලු විසඳීමට වැඩපිළිවෙලක් සකස්කර ඒ අනුව කටයුතු කළ යුතුය |

## 4. තිරසර සංවර්ධන අරමුණු

### 4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබුණද, අදාළ අරමුණු එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ස්ථාපිත කරනු ලැබූ තිරසර සංවර්ධන අරමුණු සමග සම්බන්ධවන ආකාරය සහ 2030 වර්ෂය දක්වා කාලය තුළ ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ දායකත්වය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීම සඳහා දැනටමත් නිලධාරීන්ට රාජකාරි පවරා ඇත. | තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට අවශ්‍ය දෙපාර්තමේන්තුවේ දායකත්වය හඳුනාගෙන එය ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු. රෙ. 133 අනුව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය පරිදි දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂයට අදාළව විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර වර්ෂය තුළ කිසිදු විගණන විමසුමක් නිකුත් කර නොතිබුණි. | දැනට විගණන සැලැස්ම අනුමත කර ගැනීම සිදුකර ඇත. 2022 වර්ෂයේ මේ වන විට විගණන විමසුම් 10 ක් පමණ නිකුත් කර තිබේ. | අභ්‍යන්තර විගණන සැලසුමක් අනුමත කරගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 74 ක් හා තෘතීක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 1,071 ක් ඇතුළු සමස්ත පුරප්පාඩු 1,251 ක් පැවතුණි. | මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 815 ක් වුව ද දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රය තුළ දිස්ත්‍රික් කාර්යාල තුනක් හා තවත් අතිරේක කාර්යාල 47 ක් ආරම්භ කර පවත්වා ගැනීමේ අවශ්‍යතාව තවමත් පවතී. | දෙපාර්තමේන්තුවේ විවෘත කර ඇති ප්‍රාදේශිය කාර්යාලවලට සහ විවෘත කර නොමැති උතුරු නැගෙනහිර දිස්ත්‍රික් කාර්යාල ආරම්භකර ඒ සඳහා අවශ්‍ය සේවකයින් බඳවා ගැනීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | අනුමත වී තිබුණු කොමසාරිස් තනතුරු 01ක්, දිස්ත්‍රික් කොමසාරිස්වරු 03ක්, නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් තනතුරු 68ක්, නීති නිලධාරී හා ගණකාධිකාරී යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 74 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සැලසුම්ගත ඉලක්ක හා අරමුණු ළඟා කර ගැනීමට බාධාවක් ලෙස දෙපාර්තමේන්තුව හඳුනාගෙන තිබුණ ද, අදාළ පුරප්පාඩු පිරවීමට හෝ සේවා අවශ්‍යතාවය මත අනුමත තනතුරු සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 815 ක් වුව ද දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රය තුළ දිස්ත්‍රික් කාර්යාල තුනක් හා තවත් අතිරේක කාර්යාල 47 ක් ආරම්භ කර පවත්වා ගැනීමේ අවශ්‍යතාව තවමත් පවතී. | දෙපාර්තමේන්තු අරමුණු ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමට හෝ සේවා අවශ්‍යතාවය පරිදි අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ නියෝජ්‍ය / සහකාර කොමසාරිස් තනතුර සඳහා නිලධාරීන් 18 ක් හා තෘතීක මට්ටමේ පරිපාලන නිලධාරී තනතුර සඳහා ස්ථිරව නිලධාරීන් පත් නොකර කොන්ත්‍රාත් පදනම මත පත්කර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 815 ක් වුව ද දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රය තුළ දිස්ත්‍රික් කාර්යාල තුනක් හා තවත් අතිරේක කාර්යාල 47 ක් ආරම්භ කර පවත්වා ගැනීමේ අවශ්‍යතාව තවමත් පවතී. | අනුමත කාර්යය මණ්ඩලයේ ඇතුළත් තනතුරු සඳහා සේවකයින් ස්ථිරව පත්කළ යුතුය. |
| (ඈ) | ද්විතීක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 7 ක පවතින ඇබෑර්තු 1,175 ක් පිරවීමට හෝ සේවා අවශ්‍යතාවය නැවත සලකා බලා අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 815 ක් වුව ද දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍රය තුළ දිස්ත්‍රික් කාර්යාල තුනක් හා තවත් අතිරේක කාර්යාල 47 ක් ආරම්භ කර පවත්වා ගැනීමේ අවශ්‍යතාව තවමත් පවතී. | පුරප්පාඩු පිරවීමට හෝ සේවා අවශ්‍යතාවය අනුව අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය |